අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

| | | |
|---|---|---|
| මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/10/AL/2 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2025.10. 07 |

පළාත් ප්‍රධාන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් සහ
පරිවේණාධිපති හිමිවරුන් වෙත

**<u>අ.පො.ස (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම</u>**

අ.පො.ස (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් 2008.04.30 දින නිකුත් කර ඇති 2008/17 චක්‍රලේඛයේ උපදෙස්වලට අමතරව පහත අංක 01 සහ 02 හි සඳහන් කරුණු සම්බන්ධයෙන් ලබා දී ඇති උපදෙස් අනුව 2025.10.10 දින සිට කටයුතු කළ යුතු ය.

**01. අ.පො.ස (උසස් පෙළ) හැදෑරීම සඳහා පහසුකම් සහිත දිස්ත්‍රික්කයක පාසලකින් දුෂ්කර දිස්ත්‍රික්කයක පාසලකට ඇතුළත් වීමට කරනු ලබන ඉල්ලීමක දී දුෂ්කර දිස්ත්‍රික්කයක පාසල් වෙත තාවකාලිකව අනුයුක්තයක් ලබාදීම.**

අ.පො.ස (උසස් පෙළ) පන්තිවලට ඇතුළත් වීම සඳහා ඉල්ලීමේ දී ප්‍රවේශ පහසුකම්, ආර්ථික දුෂ්කරතා, පදිංචිය වෙනස් වීම, සිසුන්ගේ රැකවරණය, සිසුවාගේ භාරකාරීත්ව ගැටලු සහ දිස්ත්‍රික් මායිම්වල පිහිටි පාසල්වල විෂය ධාරාව නොමැති වීම වැනි කරුණු ඉදිරිපත් කරමින් පහසු දිස්ත්‍රික්කයක සිට දුෂ්කර දිස්ත්‍රික්ක වෙත මාරු වීම සඳහා වන ඉල්ලීම් මෙහි දී සලකා බලනු ලැබේ.

1.1 ඒ අනුව පහසු දිස්ත්‍රික්කයක පාසලක සිට දුෂ්කර දිස්ත්‍රික්කයක පාසලක් වෙත අධ්‍යාපනය හැදෑරීම සඳහා ඉල්ලීම් කරනු ලබන සිසුන් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් කරුණු සලකා බැලීමෙන් පසුව ඉල්ලුම්කරන පාසලට **තාවකාලික අනුයුක්තයක්** ලබා දෙනු ලැබේ.

1.2 මෙම අනුයුක්ත කිරීම් පළාත් පාසල් දෙකක් අතර සිදුවන අනුයක්ත කිරීමක් නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ද ජාතික පාසලක් සම්බන්ධ කර ගනිමින් (ජාතික පාසලක සිට පළාත් පාසලක්/ පළාත් පාසලක සිට ජාතික පාසලක්/ ජාතික පාසල් දෙකක් අතර) සිදුවන අනුයුක්ත කිරීමක් නම් මෙම අමාත්‍යාංශයේ ලේකම් මගින් ද සිදු කරනු ඇත.

1.3 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශ අත්පොතෙහි දක්වා ඇති පරිදි දුෂ්කර යැයි සලකනු ලබන පහත දක්වා ඇති දිස්ත්‍රික්ක 16 සඳහා එම තාවකාලික අනුයුක්ත ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. නුවරඑළිය | 7. වවුනියා | 13.පොළොන්නරුව |
| 2. හම්බන්තොට | 8. ත්‍රිකුණාමලය | 14.බදුල්ල |
| 3. යාපනය | 9. මඩකලපුව | 15.මොණරාගල |
| 4. කිලිනොච්චිය | 10.අම්පාර | 16.රත්නපුර |
| 5. මන්නාරම | 11.පුත්තලම | |
| 6. මුලතිව් | 12.අනුරාධපුරය | |

1.3 **තාවකාලික අනුයුක්ත ලබාදීම පහත කොන්දේසිවලට යටත්ව සලකා බලනු ලැබේ.**

a) විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා මෙම අනුයුක්ත කරන ලද පාසලෙන් ඉදිරිපත් වීමට කිසිදු නෛතික හිමිකමක් මෙමගින් නොලැබෙන බව අවධාරණය කරමි.

b) සිසුවා විසින් අදාල දුෂ්කර දිස්ත්‍රික්කයේ පාසලට අයදුම් කර උසස් පෙළ විෂය ධාරාව හැදෑරීමට සුදුසුකම් මත තේරී ඇති බව හා පූරප්පාඩු පවතින බවට විදුහල්පතිගෙන් ලබා ගන්නා තහවුරුව ඉදිරිපත් කළ යුතු ය.

c) අනුයුක්ත ලබා ගැනීමෙන් පසු නැවත වෙනත් පාසල් සඳහා අනුයුක්ත වීමට කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

d) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය අත්පොත හි "යම් අපේක්ෂකයෙකු විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලෙන දිස්ත්‍රක්කය තීරණය කරන ආකාරය" ඡේදය යටතේ අපේක්ෂකයා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලෙන දිස්ත්‍රික්කය ලෙස සලකනු ලබන තුන් අවුරුදු කාල පරිච්ඡේදය තුළ අපේක්ෂකයා අධ්‍යාපනය ලැබීම සඳහා අවම වශයෙන් වසරක් හෝ වසරකට වැඩි කාලයක් ඇතුළත්ව සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කය සලකා බැලෙන බව සඳහන් කර ඇත. **ඒ අනුව තාවකාලිකව අනුයුක්ත කර ඇති සිසුවාගේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලෙන දිස්ත්‍රික්කය වන්නේ සිසුවාගේ නිත්‍ය පාසල පිහිටි දිස්ත්‍රික්කය වේ.**

e) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය හදාරා ඇති නමුත් එම පාසලේ උසස් පෙළ කිසිදු විෂය ධාරාවක් නොමැති (11 ශ්‍රේණිය දක්වා පමණක් පන්ති පැවැත්වෙන) හෝ හැදෑරීමට බලාපොරොත්තු වන විෂය ධාරාව නොමැති නම් එම පාසල්වල සිසුන් වෙනත් දිස්ත්‍රික්කයක පාසලකට අනුයුක්ත කිරීමට පෙර තම දිස්ත්‍රික්කයේ අ.පො.ස (උසස් පෙළ) පන්ති පැවැත්වෙන පාසලක් අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ලබා ගෙන එම පාසලට අනිවාර්යයෙන් ඇතුළත් වී තිබිය යුතු ය. මෙහි දී එම පාසල නිත්‍ය පාසල සේ සැලකේ.

f) තාවකාලික අනුයුක්ත කාල සීමාව තුළ විනය සම්බන්ධ තීරණ ගැනීමේ බලය තාවකාලික අනුයුක්ත කර ඇති පාසලේ විනය කමිටුව සතු වේ.

g) අ.පො.ස.(උසස් පෙළ) සඳහා විභාග අයදුම්පත් ඉදිරිපත් කිරීම සහ විභාගය සඳහා පෙනී සිටීම නිත්‍ය පාසලෙන් සිදු කළ යුතු ය.

h) අ.පො.ස (උසස් පෙළ) සිසුන් විභාගයට පෙනී සිටීම සඳහා අදාළ 80% පැමිණීම පිළිබඳ තීරණ/ ගැටළු සම්බන්ධයෙන් නිත්‍ය පාසලේ විදුහල්පති විසින් අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත.

i) සිසුවා තරග සඳහා ඉදිරිපත් වන්නේ නම් නිත්‍ය පාසල නියෝජනය වන පරිදි පමණක් සහභාගි විය යුතු ය.

1.4 අ.පො.ස (උසස් පෙළ) සිසුන් විභාගයට පෙනී සිටීම සඳහා 80% පැමිණීම සම්බන්ධ වාර්තාව තාවකාලික අනුයුක්ත පාසලේ විදුහල්පති විසින් නියමිත කාලයේ දී නිත්‍ය පාසල වෙත යැවිය යුතු ය.

1.5 තාවකාලිකව අනුයුක්ත කරන හා ඉවත් වන සිසුන් සම්බන්ධ තොරතුරු ගොනුවක් පාසල්වල නඩත්තු කළ යුතු අතර ලොග් සටහන් ද තැබිය යුතු ය. තාවකාලික අනුයුක්ත සඳහා අස්වීම් සහතික නිකුත් නොකළ යුතු අතර අස්වීම් සහතිකය නිකුත් කළ හැක්කේ පාසල් අධ්‍යාපනය අවසන් වීමෙන් පසු නිත්‍ය පාසල මගිනි.

1.6 රජය විසින් සිසුන් වෙනුවෙන් සපයනු ලබන සුභසාධන පහසුකම් (උදා: නිල ඇඳුම්, පෙළ පොත්, ලිපි ද්‍රව්‍ය වවුචර්.........ආදිය) නිත්‍ය පාසල විසින් ලබාදිය යුතු ය.

1.7 පහසුකම් හා සේවා ගාස්තු සහ පාසල් සංවර්ධන සමිති ගාස්තු ලබා ගැනීමේ දී විදුහල්පති විසින් එම මුදල පරිත්‍යාග යටතේ ගිණුම්ගත කර (තාවකාලික අනුයුක්තයක් බැවින්) රිසිට්පතක් නිකුත් කළ යුතු ය.

1.8 තාවකාලිකව අනුයුක්ත කරනු ලබන සිසුන් ඇතුළත් කිරීමේ දී තාවකාලික ඇතුළත් කිරීම් ලේඛනයක් පවත්වා ගත යුතු අතර පැමිණීම සටහන් කිරීමේ දී තාවකාලික නාම ලේඛනයක් භාවිත කළයුතු ය.

**02. නියමිත වයසට වඩා අඩු වයසේ සිසුන් රජයේ පාසල්වල අ.පො.ස (උසස් පෙළ) පන්ති සඳහා ඇතුළත් වීමට කරනු ලබන ඉල්ලීම් සලකා බැලීම.**

එක් එක් විෂයය ධාරාවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් නියමිත වයසට වඩා **අවුරුදු 1 ක් පමණක් වයසින් අඩු** රජයේ, ජාත්‍යන්තර හෝ පෞද්ගලික පාසලක 11 ශ්‍රේණියේ පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කළ සිසුන් සඳහා අ.පො.ස.(උසස් පෙළ) පන්ති සඳහා රජයේ පාසල්වලට ඇතුළත් වීමට අවස්ථාව දෙනු ලැබේ.

උදා: 2025 වර්ෂයේ රජයේ පාසල්වල 12 ශ්‍රේණිය සඳහා ඇතුළත් වීමට නියමිත වන්නේ 2008.02.01 සිට 2009.01.31 කාලය තුළ උපත ලද සිසුන් වේ. මේ අනුව 2009.02.01 දින සිට 2010.01.31 දක්වා කාලය තුළ උපත ලද සිසුන් උසස් පෙළ පන්තියට ඇතුළත් කළ හැකි ය.

අ.පො.ස (උසස් පෙළ) පන්ති සඳහා ඇතුළත් කර ගැනීමේ දී රජයේ, ජාත්‍යන්තර හෝ පෞද්ගලික පාසලක 11 ශ්‍රේණියේ පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කර ඇති බව තහවුරු කර ගැනීමෙන් පසු 2008/17 චක්‍රලේඛයේ 4.0 කරුණ (12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාවය) යටතේ ඇති සියලුම කොන්දේසිවලට අනුගතව, නියමිත වයස් සීමාවේ සිටින සිසුන් ඇතුළත් කර ගැනීමෙන් පසු තව දුරටත් පුරප්පාඩු පවතින්නේ නම් පමණක් විදුහල්පතිවරු විසින් මෙම සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

තාවකාලික අනුයුක්තයට අදාළව සම්පූර්ණ කළ යුතු ආකෘති පත්‍රය ඇමුණුම 01 හි සඳහන් වේ. මෙම ආකෘති පත්‍රය සම්පූර්ණ කර අංක1.2 වගන්තියේ උපදෙස් අනුව අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කර තාවකාලිකව අනුයුක්ත කිරීම සඳහා අනුමැතිය ලබා ගත යුතු ය.

මෙම උපදෙස් ලිපියෙන් පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

නාලක කළුවැව
ලේකම්

**පිටපත්:**

1. විභාග කොමසාරිස් ජනරාල් - දැ.ගැ.ස./ අ.ක.ස
2. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - දැ.ගැ.ස

CamScanner

**පහසු දිස්ත්‍රික්කයක සිට දුෂ්කර දිස්ත්‍රික්කයක පාසලකට අ.පො.ස (උසස් පෙළ) සඳහා තාවකාලික අනුයුක්තය ලබා ගැනීම සඳහා අයදුම් පත්‍රය**

**.......................................දිස්ත්‍රික්කයේ සිට ............................................ දිස්ත්‍රික්කය වෙත පළාත් පාසලක සිට පළාත් පාසලකට/ජාතික පාසලක සිට පළාත් පාසලකට/ පළාත් පාසලක සිට ජාතික පාසලකට/ ජාතික පාසලකින් ජාතික පාසලකට තාවකාලික අනුයුක්තය ලබා ගැනීම (අනවශ්‍ය වචන කපා හරින්න).**

01. සිසුවාගේ සම්පූර්ණ නම :- ..........................................................................................
03. උපන් දිනය :-DD........./MM........../YYYY ........................
04. ස්ත්‍රී/පුරුෂ භාවය :-..............................................
05. හැඳුනුම්පත් අංකය :-..............................................
06. ස්ථිර ලිපිනය :-..........................................................................................
06. අ.පො.ස (සා.පෙළ) හැදෑරූ පාසල:-..........................................................................................
07. අ.පො.ස (උ.පෙළ) සඳහා ඇතුළත් වූ පාසල:-..........................................................................
08. මව/ පියා /භාරකරුගේ නම :-..........................................................................

**කොන්දේසි**

a) **විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා මෙම අනුයුක්ත කරන ලද පාසලෙන් ඉදිරිපත් වීමට කිසිදු නෛතික හිමිකමක් මෙමගින් නොලැබෙන බව අවධාරණය කරමි.**

b) සිසුවා විසින් අදාල දුෂ්කර දිස්ත්‍රික්කයේ පාසලට අයදුම් කර උසස් පෙළ විෂය ධාරාව හැදෑරීමට සුදුසුකම් මත තේරී ඇති බව හා පුරප්පාඩු පවතින බවට විදුහල්පතිගෙන් ලබා ගන්නා තහවුරුව ඉදිරිපත් කළ යුතු ය.

c) අනුයුක්ත ලබා ගැනීමෙන් පසු නැවත වෙනත් පාසල් සඳහා අනුයුක්ත වීමට කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

d) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය අත්පොත හි "යම් අපේක්ෂකයෙකු විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලෙන දිස්ත්‍රික්කය තීරණය කරන ආකාරය" ඡේදය යටතේ අපේක්ෂකයා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලෙන දිස්ත්‍රික්කය ලෙස සලකනු ලබන තුන් අවුරුදු කාල පරිච්ඡේදය තුළ අපේක්ෂකයා අධ්‍යාපනය ලැබීම සඳහා අවම වශයෙන් වසරක් හෝ වසරකට වැඩි කාලයක් ඇතුළත්ව සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කය සලකා බැලෙන බව සඳහන් කර ඇත. **ඒ අනුව තාවකාලිකව අනුයුක්ත කර ඇති සිසුවාගේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලෙන දිස්ත්‍රික්කය වන්නේ සිසුවාගේ නිත්‍ය පාසල පිහිටි දිස්ත්‍රික්කය වේ.**

e) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය හදාරා ඇති නමුත් එම පාසලේ උසස් පෙළ කිසිදු විෂය ධාරාවක් නොමැති (11 ශ්‍රේණිය දක්වා පමණක් පන්ති පැවැත්වෙන) හෝ හැදෑරීමට බලාපොරොත්තු වන විෂය ධාරාව නොමැති නම් එම පාසල්වල සිසුන් වෙනත් දිස්ත්‍රික්කයක පාසලකට අනුයුක්ත කිරීමට පෙර තම දිස්ත්‍රික්කයේ අ.පො.ස (උසස් පෙළ) පන්ති පැවැත්වෙන පාසලක් අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ලබා ගෙන අනිවාර්යයෙන් ඇතුළත් වී තිබිය යුතු ය. මෙහි දී එම පාසල නිත්‍ය පාසල සේ සැලකේ.

f) තාවකාලික අනුයුක්ත කාල සීමාව තුළ විනය සම්බන්ධ තීරණ ගැනීමේ බලය තාවකාලික අනුයුක්ත කර ඇති පාසලේ විනය කමිටුව සතු වේ.

g) **අ.පො.ස.(උසස් පෙළ) සඳහා විභාග අයදුම්පත් ඉදිරිපත් කිරීම සහ විභාගය සඳහා පෙනී සිටීම නිත්‍ය පාසලෙන් සිදු කළ යුතු ය.**

h) අ.පො.ස (උසස් පෙළ) සිසුන් විභාගයට පෙනී සිටීම සඳහා අදාළ 80% පැමිණීම පිළිබඳ තීරණ/ ගැටළු සම්බන්ධයෙන් නිත්‍ය පාසලේ විදුහල්පති විසින් අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත.

i) සිසුවා තරග සඳහා ඉදිරිපත් වන්නේ නම් නිත්‍ය පාසල නියෝජනය වන පරිදි පමණක් සහභාගි විය යුතු ය.

ඉහත අංක (01) සිට (08) දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් (a) සිට (i) දක්වා වූ කොන්දේසිවලට යටත්ව තාවකාලික අනුයුක්තය ලබා ගැනීමට එකඟ වන බවත් දන්වමි.

.......................................
මව/පියා/භාරකරුගේ අත්සන

...................................
දිනය



CamScanner

**<u>නිත්‍ය පාසලේ විදුහල්පතිගේ සහතිකය</u>**

ඇතුළත් වීමේ අංක ............................ දරන ................................................................................... ශිෂ්‍යයා/ ශිෂ්‍යාව අ.පො.ස (උසස් පෙළ)............................................ විෂයය ධාරාව යටතේ මෙම පාසලට ඇතුළත් වී ඇත. ඔහු/ ඇය විසින් ......................................................................................................... (හේතුව) මත .........................................................................පාසල වෙත තාවකලික අනුයුක්ත කිරීමට ඉල්ලා ඇති අයදුම්පත ඉදිරි කටයුතු සඳහා යොමු කරන අතර අධ්‍යාපන ලේකම්ගේ 2025.10.07 දිනැති අංක ED/09/12/10/AL/2 දරන උපදෙස් ලිපියේ සඳහන් කරුණුවලට අනුකූලව මා කටයුතු කරන බව දන්වමි.

........................
විදුහල්පති අත්සන
(නිලමුද්‍රාව)

........................
දිනය

---

**<u>අනුයුක්ත වන පාසලේ විදුහල්පතිගේ නිර්දේශය</u>**

........................................................................... ශිෂ්‍යයා/ශිෂ්‍යාව අ.පො.ස (උසස් පෙළ) .................. විෂයය ධාරාව (සිංහල/දෙමල/ඉංග්‍රීසි මාධ්‍ය) සඳහා අයදුම් කර අවශ්‍ය සුදුසුකම් මත තේරි පත් වී ඇති බවත්, අදාළ විෂයය ධාරාව සඳහා මෙම විද්‍යාලයේ පුරප්පාඩු පවතින බවත් දන්වමි. මෙම ශිෂ්‍යයා/ශිෂ්‍යාව ...................................................................විද්‍යාලයට තාවකාලික අනුයුක්ත කර ගැනීමට අනුමැතිය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

........................
විදුහල්පති අත්සන
(නිලමුද්‍රාව)

........................
දිනය

---

**පළාත් පාසලකට** අනුයුක්ත වන අවස්ථාවල දී පහත A සහ B කොටස් සම්පූර්ණ කළයුතු ය. පළාත් පාසලකට අනුයුක්ත කිරීමේ දී අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගැනීම ප්‍රමාණවත් වේ.

(A) <u>අනුයුක්ත වන පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය</u>

උක්ත විදුහල්පතිවරුන් විසින් දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන ........................................................... ශිෂ්‍යයා/ ශිෂ්‍යාව.................................................................................................දිස්ත්‍රික්කයේ .........................................................................පාසලේ සිට .........................................දිස්ත්‍රික්කයේ ...........................................පාසල වෙත තාවකාලික අනුයුක්ත කිරීම නිර්දේශ කරමි.

........................
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
(නිලමුද්‍රාව)

........................
දිනය

---

(B) <u>අනුයුක්ත වන පාසල අයත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය</u>

උක්ත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය මත ..................................................... ශිෂ්‍යයා/ ශිෂ්‍යාව...................................................................................................දිස්ත්‍රික්කයේ............................ ...............................................පාසලේ සිට ...........................................................දිස්ත්‍රික්කයේ ...............................................පාසල වෙත තාවකාලික අනුයුක්ත කිරීම අනුමත කරමි.

........................
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
(නිලමුද්‍රාව)

........................
දිනය



CamScanner

ජාතික පාසලකට අනුයුක්ත වන අවස්ථාවල දී පහත C සහ D කොටස් සම්පූර්ණ කර අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

(C) <u>අතිරේක ලේකම් (පාසල් කටයුතු) ගේ නිර්දේශය</u>

උක්ත විදුහල්පතිවරුන් විසින් දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන ....................................................... ශිෂ්‍යයා/ශිෂ්‍යාව.....................................................................................................දිස්ත්‍රික්කයේ ............................................................................පාසලේ සිට ...........................................දිස්ත්‍රික්කයේ ............................................පාසල වෙත තාවකාලික අනුයුක්ත කිරීම නිර්දේශ කරමි.

.........................

අතිරේක ලේකම් (පාසල් කටයුතු)

(නිලමුද්‍රාව)

........................

දිනය

(D) <u>අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය</u>

උක්ත නිර්දේශය මත.................................................................................................. ශිෂ්‍යයා/ ශිෂ්‍යාව ...............................................................................................පාසලට තාවකාලික අනුයුක්ත කිරීම අනුමත කරමි.

...........................

නාලක කලුවැව
ලේකම්

............................

දිනය

සැ.යු.

පළාත් පාසලකට අනුයුක්ත කිරීමක දී නිත්‍ය පාසලේ විදුහල්පතිගේ සහතිකය සහ අනුයුක්ත වන පාසලේ විදුහල්පතිගේ නිර්දේශය මත ඉහත **A** සහ **B** කොටස් සම්පූර්ණ කර අනුමැතිය ලබා ගැනීම ප්‍රමාණවත් වේ.

ජාතික පාසලකට අනුයුක්ත කිරීමක දී නිත්‍ය පාසලේ විදුහල්පතිගේ සහතිකය සහ අනුයුක්ත වන පාසලේ විදුහල්පතිගේ නිර්දේශය මත C සහ D කොටස් සම්පූර්ණ කර අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.



CamScanner